## මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2012

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**(ඇ)** ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර), කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

**(ඈ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

**(ඉ)** ණය ගිවිසුමේ දක්වා තිබූ මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

#### 2.1 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘති වියදම රු. 256,039,009 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 1,853,389,108 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම, ඉකුත් වර්ෂය සඳහා වූ වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| **උපකරණ :** | | | |
| පැකේජ- II (උපදේශක) | (1,680,028)* | - | 3,702,898 |
| **කෙරීගෙන යන වැඩ :** | | | |
| **(ව්‍යාපෘති වියදම්)** | | | |
| පැකේජ - II (උපදේශක) | 4,372,793 | 11,888,776 | 115,340,736 |
| නැගෙනහිර හා උතුරුමැද පළාත් | (132,547)** | - | 6,684,329 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | - | - | (4,591,646) |
| **උපදේශකවරුන් :** | | | |
| පැකේජ - I | - | 685,495 | 399,531,991 |
| පැකේජ - II | - | 343,043 | 410,811,723 |
| පැකේජ - I | 258,100 | 5,236,781 | 169,454,270 |
| පැකේජ - V | 3,020,654 | 85,930,855 | 236,525,310 |
| පැකේජ මාර්ග සඳහා අතිරේක මුල්‍යයන | 185,113,251 | - | 185,113,251 |
| පුද්ගල උපදේශකවරු | - | - | 4,045,039 |
| ජලගැලීම් හානි තක්සේරුව | - | 5,106,023 | 5,106,023 |
| උපදේශක සේවාවන් - යාපනය | 4,533,449 | 38,652,673 | 91,768,958 |
| උපදේශක සේවාවන් - කි.මී. 400 | 53,880,514 | 93,560,894 | 177,097,420 |
| ප්‍රසම්පාදන උපදේශකත්වය | - | 349,837 | 14,947,328 |
| සැකසුම් කාර්යයන් - උතුරු පළාත් මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය | - | - | 902,065 |
| සැකසුම් කාර්යයන් - ගැටුම් වලින් බලපෑමට පත් කලාප හදිසි ව්‍යාපෘතිය | - | (733,787) | 854,701 |
| පොලී ගාස්තු | 6,672,823 | 10,956,052 | 36,094,712 |
| | 256,039,009 | 251,976,642 | 1,853,389,108 |

* ස්ථාවර වත්කම් ක්ෂය කිරීම හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට, මාර්ග සංවර්ධන අධිකාරියට වත්කම් මාරුකිරීමේ හේතුවෙන්.

** ප්‍රත්‍යාගණන අග්‍රිමය ගැලපීම් හේතුවෙන්

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත දැක්වේ.

**අග්‍රිම ගිණුම් අංක 5930**

| | එ.ජ.ඩො | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 9,996 | 1,138,600 |
| එකතු කලා : ඌනපූරණයන් | නැත | නැත |
| විදේශ විනිමය ලාභය | - | 132,547 |
| | 9,996 | 1,271,147 |
| අඩු කළා : | | |
| ආපසු ගැනීම් | නැත | නැත |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 9,996 | 1,271,147 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** කොන්ත්‍රාත්තු විචලන අංක 1 යොමුගත කොන්දේසි (TOR) අනුව අතිරේක ජාතික මාර්ගවල හා පළාත් මාර්ගවල ප්‍රාරම්භක වැඩ උපදේශක සේවාවේ විෂය පථයට සමාජ තක්සේරු වාර්තා (SAS), නැවත පදිංචි කිරීමේ සැලසුම්, පාරිසරික තක්සේරු වාර්තා, විස්තරාත්මක නිර්මාණ පිරිවිතරයන්, හා පිරිවැය ඇස්තමේන්තු සැකසීම ඇතුළත්ව තිබුණි. කලින් සිටි උපදේශකවරුන් මෙම වාර්තා පිළියෙල කර ඇතත් එම වාර්තා සමාලෝචනය හා යාවත්කාලීන කිරීමට යොමුගත කොන්දේසි පැවරුමක් නිකුත් කර තිබුණි. උපදේශකවරුන් මෙම වාර්තා සමාලෝචනය කළාද යන්න සාධාරණ සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.6 ඡේදය අනුව ඒකාබද්ධ අරමුදලින් ප්‍රදානයන් ලබන ව්‍යවස්ථාපිත මණ්ඩල එකතු කල අගය මත බදු හා පොදුකාර්ය වියදම් සඳහා බැඳීම් නොමැති වුවත්, ඊට පටහැනිව රු. 72,395 ක පොදුකාර්ය පිරිවැය හා එකතු කල අගය මත බදු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබුණි.

**(ඇ)** 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ දක්වා ඇති වැටුප් ව්‍යුහය වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වාදී ඇති වැටුප් ක්‍රමයකට අනුකූලව ව්‍යාපෘති නිලධාරියෙකුට වැටුප් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ කරගත යුතු වැටුප් පරිමාණයන් හා සැසඳීමේදී රු.20,926 ක් ව්‍යාපෘතිය විසින් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඈ)** මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුයුක්ත කරන ලද ව්‍යාපෘතියේ වැඩකරන නිළධාරියෙකුට පාරිතෝෂික ගෙවීම් අදාළ නොවන නමුත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 11 වගන්තියේ උපදෙස්වලට පටහැනිව පාරිතෝෂික ගෙවීම් ලෙස රු. 12,060 ක් ගෙවා තිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2012 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් සැලකිය යුතු දත්ත කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවයන් | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2012 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය | වර්ෂයේ උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| ආ.සං.බැං | 15 | 1,476.75 | 250.0 | 210.21 | 1,478.81 | 84 |
| ශ්‍රී ලංකා රජය | 05 | 492.25 | 33.5 | 33.5 | 360.49 | 100 |
| | 20 | 1,969.00 | 283.5 | 243.71* | 1,839.3** | |

* රු. 12,255,113 ක සෘණ කාරක ප්‍රාග්ධනය හේතුවෙන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත චීන ප්‍රදාන ආධාර ව්‍යාපෘතිය විසින් පාවිච්චි කළ රු. 69,243 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියට මාරුකිරීමේ හේතුවෙන් මෙම සංඛ්‍යාව 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යාවෙන් වෙනස් වේ.

** සෘණ කාරක ප්‍රාග්ධනය රු. 12,912,301 ක් හා ප්‍රදාන රු.1,177,592 ක් හේතුවෙන් මෙම සංඛ්‍යාවන් 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යාවෙන් වෙනස් වේ.

## 4.2 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය පළාත් මාර්ග නියෝජිතායතනවල සහභාගීත්වයෙන් නූතන කාර්යක්ෂම මාර්ග ජාලයන්ගේ අවශ්‍යතා සඳහා පුනරුත්ථාපන හා වැඩිදියුණු කළ යුතු මාර්ග හඳුනාගෙන තිබුණි.

ජාතික මහාමාර්ග කිලෝමීටර් 2,200 හා පළාත් මාර්ග කිලෝමීටර් 2,900 ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම් සඳහා තෝරාගෙන ඇති බව නිරීක්ෂණය විය. කෙසේවෙතත් ජාතික මහාමාර්ග කි.මී. 3,141 ක් හා පළාත් මාර්ග කි.මී 3,119 ක් සඳහා රු. මිලියන 1,387 ක උපදේශක කොන්ත්‍රාත්තුවක් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව 2012 දෙසැම්බර් 31 දිනට කිලෝමීටර් 4,940 කට අදාළව ශක්‍යතා හා විස්තරාත්මක සැලසුම් ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ කොන්ත්‍රාත්තු පිළිබඳ භෞතික ප්‍රගතිය හා සමුච්චිත වියදම් පහත දැක්වේ.

| පැකේජ | කොන්ත්‍රාත්තු අනුව මාර්ගයේ දිග | නිමකරන ලද මාර්ගයේ දිග | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | කි.මී | කි.මී | රු. මිලියන |
| පැකේජ I | 1,500 | 27 - ශ.අ<br>157 - වි.සැ | 268.7 |
| පැකේජ II | 2,400 | 2,400 | 410.8 |
| පැකේජ 1 බී | 351 | 347 | 130.8 |
| පැකේජ 1 සී | 664 | 664 | 169.4 |
| පැකේජ වී සහ වී ඒ | 436 | 436 | 158.3 |
| පැකේජ වී බී | 77 | 77 | 78.2 |
| පැකේජ එක්ස් - එන් එච් | 113 | 113 | 185.1 |
| පැකේජ එක්ස් - පළාත් මාර්ග | 69 | 69 | |
| යාපනය | 250 | 250 | 91.8 |
| කිලිනොච්චි/මුලතිව් | 400 | 400 | 177 |
| | 6,260 | 4,940 | 1,670.1 |